# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
# இலங்கைச் சனநாயக சோசலிசக் குடியரசு வர்த்தமானப் பத்திரிகை
# The Gazette of the Democratic Socialist Republic of Sri Lanka

අති විශෙෂ　அதிவிசேஷமானது　EXTRAORDINARY

අංක 831/17 – 1994 අගෝස්තු 12 වැනි සිකුරාදා – 1994.08.12
831/17 ஆம் இலக்கம் — 1994 ஆம் ஆண்டு ஓகத்து மாதம் 12 ஆம் திகதி வெள்ளிக்கிழமை
No. 831/17 – FRIDAY, AUGUST 12, 1994

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)　(அரசாங்கத்தின் அதிகாரத்துடன் பிரசுரிக்கப்பட்டது)　(Published by Authority)


## I වැනි කොටස : (I) වැනි ඡෙදය – සාමාන්‍ය

### ආණ්ඩුවේ නිවේදන

ඇල්.ඩී.–බී. 21/78.

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 18 වන වගන්තිය සමග කියවිය යුතු ඒ පනතේ 140 වන වගන්තිය යටතේ. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සාදන ලද නියමාවලිය.

ලේකම්.
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව.

කොළඹ දී ය.

නියමාවලිය

1. මේ නියමාවලිය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතන (සංශෝධන) නියමාවලිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ දිනයෙහි එය ක්‍රියාත්මක විය යුතු ය

2. 1993 දෙසැම්බර් මස 08 වන දින අංක 796/6 දරන **අති විශෙෂ** ගැසට් පත්‍රයේ පළ කරන ලද වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතන (සංශෝධන) නියමාවලිය මගින් අවසන්වරට සංශෝධිත, 1980 අප්‍රේල් මස 10 වන දින අංක 83/7 දරන **අති විශෙෂ** ගැසට් පත්‍රයේ පළ කරන ලද 1980 අංක 01 දරන වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතන නියමාවලිය පහත දක්වෙන පරිදි මෙයින් වැඩිදුරටත් සංශෝධනය කරනු ලැබේ :–

(1) එහි 13 වන ඡේදයේ "(ට)" අනුඡේදය අගට පහත දක්වෙන අනුඡේදය එකතු කිරීමෙන් :–

"(ඨ) චර්ම වෛද්‍ය විද්‍යාව"

(2) එහි 25 වන ඡේදයේ "වෛද්‍ය විශේෂඥ ක්ෂේත්‍රය" යන්නෙහි අර්ථකථනයේ "වෛද්‍ය පරිපාලනය සහ සෞඛ්‍ය විද්‍යාව" යන වචන වෙනුවට "වෛද්‍ය පරිපාලනය, සෞඛ්‍ය විද්‍යාව සහ චර්ම වෛද්‍ය විද්‍යාව" යන වචන ආදේශ කිරීමෙන්.

08–472
1A – D 033404 – 1,260 (94/08)